

# බොන්සායි ගසකි මා තනිවුණ.............

හිරු රැසක උණුසුම
වැහි බිඳක සිසිලස
අහිමි විය මෙමට
පෙර පින් මඳ වී ද නොදනිමි.

මිහිතලයේ ගැඹුරින්
දිය අරන් බිඳෙන් බිඳ
මල් කැකුළු පුබුදුවා
මියුරු එල සදන්නට
බලා උනිමි මම එදවස

සුවිසල් මැදුරක් තුළ අද
දිළෙන විදුලි එළි මැද
මේ මහා පවුරෙන් මදකට එබී
මගේ මිතුරන් සමඟ හිනැහෙමි

උපන් බිම අහිමි කොට
වැඩෙන අතු ඉති මුල් ද සිඳ බිඳ
රැහැනින් තදින් වෙළා සියොලඟ
කිරා මැන සැදූ බඳුනක ගාල් කොට
අහෝ මට කළ විපත නුඹ

රස බොජුන් දිදී මට නිසි කලට
පැනින් නහවන නමුදු උදෑසන සවසද
කුමන සුවයක් ද මට මිනිසුනේ
මං අයිති නැති ලෝකයක!

සැනෝජි රුවිනිකා පෙරේරා
භාෂා පරිවර්තක
පරිසර අමාත්‍යාංශය.